

සබරගමුව අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Covid 19 සති පාසල් වැඩ සටහන
නාට්‍ය හා රංග කලාව
13 ශ්‍රේණිය
තෙවන වාරය
2020.05.26 - 2020.05.29



කාලච්ඡේද : 08

- සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01). 'රූකඩ ගෙදර 'නාට්‍ය යේ තෝරාගේ චරිතය හා සම්බන්ධ ප්‍රධාන සංකේත තුන වන්නේ ,

i. කලූ කාඩ්පත් ,තරන් තලා හා තැම්බූ රිනය ය
ii. මැකරූන්,තරන්තලා හා නත්තල් ගස ය
iii. පියානෝව ,නත්තල් ගස හා පැන ය
iv. සෙල්ලම් අශ්වයා, මැකරූන් හා තරන්තලා ය
v. නත්තල් ගස, පියානෝව හා සීත කබා ය

(02). ජුලියස් සීසර් නාට්‍ය ට අදාළ නොවන ප්‍රකාශය වන්නේ ,

i. ජුලියස් සීසර් ඓතිහාසික ශෝකාන්ත නාට්‍යයකි
ii. රෝම දේශපාලන සිදුවීමක් පදනම් කොට ගත්තකි
iii. ග්‍රීක දේශපාලන සිදුවීමක් පදනම් කොට ගත්තකි
iv. ස්ත්‍රී චරිත අවම වශයෙන් යොදා ඇත
v. 'ශ්‍රේෂ්ඨ රෝමයා යන සංකල්පය ඉස්මතු වන ලෙස රචනා කරනු ලැබ ඇත.

(03). පහත (i),(ii),(iii), හා (iv) යටතේ ප්‍රකාශ කීපයක් ද, A සිට G දක්වා නාට්‍ය කීපයක නම් ද දැක්වේ .

(i) ''මම ඉල්ලමි ඔබෙන් මිය ගොස් සිටින ඇයගේ අවමගුල් කටයුතු කරවන ලෙස ගෞරවයෙන් "
(ii) මම උත්සාහ කරනවා මම ද නැත්නම් සමාජ රටාව ද හරි කියන එක නිවැරදිව තෝරා බේරා ගන්න
(iii) ඝෝර නද කර, බියට පත් කර මහද සියුමැලි කවුද ආවෙ "
(iv) මේ වගේ නිවට නියාළුවෙකුට මේ ලෝකේ හැම මිනිහෙක්ම අභිබවා යන්න ලැබිච්ච එක නං මට අදහාගන්නත් බැහැ "

A - රූකඩ ගෙදර B - ඊඩිපස් රජ C - ඔතෙලෝ D - කුවේණි
E - ඇන්ටිගනි F - අභිඥාන සාකුන්තලය G - ජුලියස් සීසර්

ඉහත i , ii, iii, iv යන ප්‍රකාශ අනුපිළිවෙලින් ඒවා අන්තර්ගත නාට්‍යවල නම් නිවැරදිව පෙළගස්වා ඇති වරණය තෝරන්න .

1. A,B,C,D 2. B,A,D,G 3. G,A,F,D 4. D,C,G,A 5. E,C,F,A

(04). ශ්‍රී ලංකා ඉතිහාසය තුළ ඓතිහාසික වෘතාන්තයක් මූලික කරගනිමින් නිර්මාණය වූ නාට්‍යයේ සංවාද කාණ්ඩය අයත් වරණය තෝරන්න .

1. A ය. 2. B ය. 3. C ය. 4. D ය. 5. E ය.

(05). අභිඥාන සාකුන්තලය ට අදාළ නො වන පිළිතුර වන්නේ,

i. පද්ම පුරාණයේ එන කතාවක් මත පදනම් වී ඇත .
ii. දුර්වාසස්ගේ ශාපය කාලිදාසගේ ම නිර්මාණයකි .
iii. නාට්‍ය යේ ප්‍රධාන තේමාව වනුයේ දුෂ්‍යන්ත හට සිය පුතු හමුවීමය .
iv. නාට්‍යයට එම නම ලැබී ඇත්තේ එක්තරා සිහිවටන වස්තුවක් එහි ප්‍රධාන තැනක් ගන්නා නිසා ය .
v. ශකුන්තලා හැදුණු වැඩුණු අසපුවේ කුලපති කන්ව තවුසා "කාශ්‍යප" නමින් ද හැඳින්වේ.

## II - කොටස

(01). ප්‍රේක්ෂකයා යනු කවරෙක්ද යන්න හඳුන්වා නාට්‍යයක පැවැත්මට ප්‍රේක්ෂක ප්‍රතිචාර ඉවහල් වන්නේ කෙසේදැයි විමසන්න.

(02). නාට්‍ය දර්ශනයකට විචාරයක් සපයන ප්‍රේක්ෂකයා සැලකිල්ලට ගත් යුතු කරුණු කවරේද?

(03). නාට්‍ය ඉදිරිපත් කරනු ලබන රංග ශෛලිය, නලුනිලියන්ගෙ රූපණ කුසලතා, ආනුශාංගික කලා, කෙතෙක් දුරට නාට්‍යයේ ගුණාත්මකභාවය සංවර්ධනයට දායක වන්නේද යන්න ප්‍රේක්ෂකයකු වශයෙන් අදහස් දක්වන්න.

(04). නාට්‍යයක සාර්ථකත්වය රඳා පවතින්නේ ප්‍රේක්ෂකයා ඉන් ලබන රසය මත ද, නොඑසේ නම් ඔවුන්ට ඉන් සන්නිවේදනය වන පණිවිඩය මත ද? ඔබේ පිළිතුර නිර්දිෂ්ට නාට්‍ය මගින් පැහැදිලි කරන්න.

(05). කුවේණි නාට්‍යය සිංහල ප්‍රේක්ෂකයින් අතර අතිශය ජනප්‍රිය වූ නාට්‍යයක් බවට පත්වීමට හේතු විමසන්න.

(06). යථාර්ථවාදී නාට්‍යයක් ලෙස " රූකඩ ගෙදර " නාට්‍යයේ සාර්ථකත්වය හෝ අසාර්ථකත්වය පිළිබඳ විවරණයක් කරන්න.